263156

(18)

# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 20 දරන

# අපරාධ නඩු විධාන සංග්‍රහය

# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 ඔක්තෝබර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : ශත 90 යි.    තැපැල් ගාස්තුව : රු.

**1995 අංක 20 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 19 වන දින]

එල්.ඩී.—ඕ.3/95

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1995 අංක 20 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2 (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි ''වරදක් සඳහා වරදකරුවකුට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක්'' යන වචන වෙනුවට ''කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමය විධානාත්මක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් වන්නා වූ යම් අවස්ථාවක දී හැර, වරදක් සඳහා වරදකරුවකුට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක්'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.'' 1979 අංක 15 දරන පනතේ 303 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) 286 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන් :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| —''286අ. | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශන ආදිය | එම | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු වූද, අවුරුදු දහයක් නොඉක්ම වන්නාවූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීම. ඊට අතිරේකව දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය.'' |

(2) 302 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම දැක්වෙන ශීර්ෂ පාඨය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කිරීමෙන්:-

'' ගබ්සා කිරීම, නූපන් දරුවන්ට පීඩා කිරීම ළදරුවන් අත්හැර දැමීම, ළමයින් කෲරත්වයට භාජනය කිරීම, සහ දරු උපත් සැඟවීම'';

2 — ඩී 036716 — 10,930 (95/09)

(3) 308 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන් :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "308අ. | ළමයින් කෲරත් වයට භාජනය කිරීම. | එම | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නො ඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. ඊට අමතරව දඩයකින් සහ වන්දි ගෙවීමට නියම කිරීමෙන් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය." |

(4) 345 වන වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන්:-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "345 | ලිංගික අතවර කිරීම. | එම | එම | එම | එම | අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම සහ වන්දි ගෙවීම | මහෙස්ත්‍රාත් අධිකරණය." |

(5) 349 වන වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම ඇති ශීර්ෂ පාඨය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කිරීමෙන්:—

" අපහරණය, පැහැර ගෙන යෑම, ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, කැනැත්තන් වෙළෙඳාම් කිරීම සහ බලෙන් වැඩ ගැනීම".

(6) 360අ වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කොට ඒ වෙනුවට, පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන්;—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "360අ | කුට්ටනය | වරෙන්තුවක් නොමැතිව සිරභාරයට නොගත යුතුය | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නො ඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. ඊට අතිරේකව දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය." |

(7) 360අ වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් සටහන් ඇතුළත් කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම. | එම | එම | එම | එම | අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම: ඊට අතිරේකව දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| 360ඇ | හැංගැස්සීමක් වෙළෙඳාම් කිරීම. | එම | එම | එම | එම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම. ඊට අතිරේකව දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | ළමයකු සම්බන්ධයෙන් එම වරද සිදු කර ඇති අවස්ථාවකදී | එම | එම | එම | එම | අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීම. ඊට අතිරේකව දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. | මහෙස්ත්‍රාත් අධිකරණය' |

(8) 361 වන වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කිරීමෙන් ;

(9) 362 වන වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කිරීමෙන් ;

(10) 362ඇ වගන්තියට ඉක්බිතිව ම ඇති ශීර්ෂ පාඨය ඉවත් කොට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ඒ වෙනුවට ආදේශ කිරීමෙන්:—

" ස්ත්‍රී දූෂණය සහ ව්‍යභිචාරය ";

(11) 364 වන වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන් :—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 364 | ස්ත්‍රී දූෂණය | වරෙන්තුවක් නැතිව සිර භාරයට ගත හැකිය, | එම | ඇපදිය නොහැකිය, | එම | අවුරුදු හතකට නො අඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්ම වන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩයක් සහ ඊට අමතරව, වන්දියක් ගෙවීමට නියම කිරීම සහ එකී වන්දිය ගෙවීම පැහැර හරිනු ලැබූ වහොත් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි වැඩිදුරටත් වූ කාලයකට බන්ධනාගාරගත කිරීම | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (අ) තමාගේ භාරයේ සිටින ස්ත්‍රියක් රජයේ නිලධරයකු විසින් දූෂණය කිරීම. | එම | එම | එම | එම | අවුරුදු දහයකට නො අඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්ම වන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩයක් සහ, ඊට අමතරව, වන්දියක් ගෙවීමට නියම කිරීම සහ ඒ වන්දිය ගෙවීම පැහැර හැරියහොත් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි වැඩිදුරටත් වූ බන්ධනාගාර ගත කිරීම | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (ආ) රක්ෂණ නිවාසයක, හෝ කාන්තා හෝ ළමා ආයතනයක යනාදියක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්යමණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ නිවාසයේ හෝ ආයතනයේ නේවාසික ස්ත්‍රියක් දූෂණය කිරීම, | එම | එම | එම | එම | අධිකරණය විසින් සමහර අවස්ථාවල දී අවුරුදු දහයකට අඩු කාලයකට බන්ධනාගාර ගතකිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකිය, | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (ඇ) රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ රෝහලේ ස්ත්‍රියක් දූෂණය කිරීම, | එම | එම | එම | එම | | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (ඈ) ගර්භනී ස්ත්‍රියක් දූෂණය කිරීම, | එම | එම | එම | ම | | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (ඉ) අවුරුදු දහඅටකට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම, | එම | එම | එම | එම | | මහෙස්ත්‍රාත් අධිකරණය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | (ඊ) මානසික හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කිරීම, | එම | එම | එම | එම | | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | (උ) රංචු ගැසි ස්ත්‍රී දූෂණය කිරීම, | එම | එම | එම | එම | | |
| | අවුරුදු දහසයකට අඩු ස්ත්‍රියක් දූෂණය කරනු ලැබූ අවස්ථාවක දී ඒ පුරුෂයාට ඒ ස්ත්‍රිය කෙරෙහි 364අ වගන්තියේ දක්වා ඇති ඥාති සම්බන්ධතාවලින් කිසිවක් වේ නම් | එම | එම | එම | එම | අවුරුදු පහළොවකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩයක් | මහෙස්ත්‍රාත් අධිකරණය.'' |

(12) 364අ වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| '' 364අ | ව්‍යභිචාරය | එම | එම | එම | එම | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | එම වරද කිරීමට තැත්කිරීම | එම | එම | එම | එම | අවුරුදු දෙකක කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩයක් | මහෙස්ත්‍රාත් අධිකරණය.'' |

(13) 364අ වගන්තියට ඉක්බිතිවම අදළ සටහන්වලට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ඇතුළත් කිරීමෙන්:—

"අස්වාභාවික වැරදි සහ බරපතල ලිංගික අපයෝජනය'';

(14) 365 වන වගන්තියට අදාළ සියලුම සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| '' 365 | අස්වාභාවික වැරදි | එම | එම | එම | එම | අවුරුදු දහයක කාලයකට දෙයාකරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හා දඩය | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් එම වරද සිදු කරන විටදී | එම | එම | එම | එම | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩය හා වන්දි | මහෙස්ත්‍රාත් අධිකරණය.'' |

(15) 365අ වගන්තියට අදාළ සියළුම සටහන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන සටහන් ආදේශ කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| " 365අ | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | එම | එම | එම | එම | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස් ත්‍රාත් අධිකර ණය. |
| | අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් එම වරද සිදු කරන විටදී | එම | එම | එම | එම | අවුරුදු දහය කට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීම සහ දඩය සහ වන්දි | මහෙස් ත්‍රාත් අධි කරණය." |

(16) 365අ වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "365 ආ | බරපතල ලිංගික අපයෝජනය | එම | එම | එම | එම | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්ස නොඉක්ම වන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම සහ දඩය සහ වන්දි | මහෙස්ත්‍රාත් අධිකරණය. |
| | අවුරුදු දහඅට කට අඩු තැනැත් තකු සමග එම වරද සිදු කරන විටදී | එම | එම | එම | එම | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්ම වන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීම හා දඩය සහ වන්දි | මහෙස්ත්‍රාත් අධිකරණය." |

(17) 365ආ වගන්තියට අදාළ සටහන්වලට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ඇතුළත් කිරීමෙන්:—

" ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම " ;

(18) "ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම" යන ශීර්ෂ පාඨයට ඉක්බිතිව ම පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන්:—

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "365ඈ | ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම. | වරෙන්තුවක් නැතිව සිරභාරයට නොගත යුතු ය. | වරෙන්තුව | ඇපදිය හැකිය | සමථයට පත්කළ හැකි ය. | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීම හෝ දඩය හෝ ඒ දෙකම | මහෙස්ත්‍රාත් අධිකරණය". |

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.